# අප ආ ගමන් මග...

1988 වසර වන විට මෙරට තිබුණු ප්‍රථම හා එකම ඡායාරූප වර්ණ රසායනාගාරයේ දීර්ඝ කාලයක් සේවය කිරීම තුළින් හා වර්ණ රසායනාගාර පිළිබඳව වූ තාක්ෂණික දැනුම ඒ පිළිබඳව පළපුරුද්දක් ඇති මහාචාර්‍යවරුන්ගේ පුහුණුව ද තුළින් ලබා ගන්නා ලද අත්දැකීම්, පළපුරුද්ද හා දැනුම ඔස්සේ තම මුල්ම මැනුවල් පින්ටින් ආයතනය ආරම්භ කරන ලදී.

ඉන් අනතුරු 2009 වසරේදී එම මැනුවල් පින්ටින් ආයතනය වැඩි දියුණු කර ඒ වන විට ඡායාරූප වර්ණ රසායනාගාර ක්ෂේත්‍රය තුළ පැවති නවීනතම ඩිජිටල් තාක්ෂණය යොදා ගනිමින් ප්‍රථම ලක්සේයා ශාඛාව කිරිබත්ගොඩදී ආරම්භ විය. එහිදී ප්‍රථම වරට පාරිභෝගිකයාට ඩිජිටල් තාක්ෂණය යොදා ගනිමින් තම අවශ්‍යතාව සපුරා ගැනීමේ භාග්‍ය උදාවිය. සේවකයන් 13ක් මගින් මුලින්ම ආරම්භ කළ මෙම ලක්සේයා ආයතනය මේ වන විට සේවකයන් 60කට අධික පිරිසක් සේවය නියුතු වේ. කිරිබත්ගොඩ, ගම්පහ හා මාතර නගර කේන්ද්‍ර කර ගනිමින් දිවයින් පුරා ශාඛා 03කින් සමන්විත වේ.

ඡයාරූප මුද්‍රණය කිරීම තුළින් ආරම්භ වූ ලක්සේයා ආයතනය තුළ දැන් ඡයාරූප ක්ෂේත්‍රයට අදාළ සියලුම සේවාවන් එකම වහලක් යටින් සිදුකර ගැනීමට හැකියාව ලැබී ඇත. මීට අමතරව සියලුම වර්ගයේ ආකනයිනක පාටෝ ප්‍රේම් වර්ග සහ ෆෙලෙක්ස් ප්‍රින්ටින් (Flex Printing) සේවාව ද දැන් පාරිභෝගික ඔබ සැමට ලබා දීමට අප කටයුතු යොදා ඇත.

ලක්සේයා ආයතන තුළ භාවිතා වන සියලුම අමුද්‍රව්‍ය පිටරටින් ආනයනය කළ ඒවා වන අතර පාරිභෝගිකයා හට වඩා උසස් සේවාවක් ලබා දීම සඳහා අපගේ මුද්‍රන කටයුතු සඳහා කොඩැක් පේපර්ස් (Kodak Papers) හා කොඩැක් කෙමිකල්ස් (Kodak Chemicals) පමණක් භාවිතා කරනු ලබයි. එම නිසාම අප ආයතනය මගින් මුද්‍රණය කරන සියලුම ඡයාරූප සඳහා ජීවිත කාලය පුරාවටම වූ වගකීමේ සහතිකයක් ලබා දේ.

අපගේ ඇති සුවිශේෂම සේවා පහසුකම වන්නේ මංගල ඇල්බම් ඇතුලු සියලුම ඇල්බම් සඳහා සුවිශේෂ වූ එක් දින සේවාව වේ. මෙම සේවාව ප්‍රථම වරට මෙරට ජනතාවට හඳුන්වා දුන්නේ අප ආයතනය විසින් බව අප සාඩම්බරයෙන් ප්‍රකාශකර සිටිමු.